දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය } NA/07/03/2023 පොදු/01
எனது இல }
My No. }

ඔබේ අංකය }
உமது இல }
Your No. }

දිනය } 2024.05. 15
திகதி }
Date }

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதாரஅமைச்சு
# Ministry of Health

<u>සිසුහෙද පුහුණුවට බඳවා ගැනීම - 2023</u>

<u>නොපැමිණි අයදුම්කරුවන් නැවත සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම.</u>

අංක **2350** දරණ **2023.09.15** දිනැති ගැසට් නිවේදනයේ විධිවිධානවලට යටත්ව සිසු හෙද පුහුණුව සඳහා 2021 කණ්ඩායමේ අයදුම්කරුවන් (2019 හා 2020 අ.පො.ස. උ/පෙළ සමත්) **3862** දෙනෙකු අතරින් සුදුස්සන් තෝරා ගැනීමට අදාළව සම්මුඛ පරීක්ෂණ දිස්ත්‍රික් මට්ටමින් **2024.01.13** දින සිට **2024.02.18** දින දක්වා පවත්වන ලදි. අදාළ සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී නොවූ සංඛ්‍යාව **994** ක් වේ. උක්ත සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී නොවූ අයදුම්කරුවන්ගේ නාම ලේඛනය ඇමුණුම **01** මගින් දක්වා ඇත. ඒ අනුව ඔබගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා නැවත පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය **2024.05.26** වන දින අංක. 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 හි පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශ පරිශ්‍රයේ දී පෙ.ව. **8.30** සිට පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

02. ඒ අනුව ඇමුණුම **01** මගින් දක්වා ඇති නාම ලේඛනයේ ඔබට හිමි කැඳවීම් අංකය අනුව, නියමිත දිනයේදී නියමිත ස්ථානය වෙත පහත ලිපිලේඛනවල **මුල් පිටපත්** සමඟ සත්‍ය බවට තමන් විසින් සහතික කරන ලද ඡායා පිටපත් ද රැගෙන පෙ.ව. 8.00ට පෙර පැමිණෙන මෙන් දන්වමි. ඡායා පිටපත් සියල්ල කාඩ්බෝඩ් ලිපිගොනුවක අමුණා ඉහළ දකුණු පස ඔබගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය, හා කැඳවීම් අංකය සටහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත භාරදිය යුතු ය. සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළයුතු ලිපිලේඛන පහත පරිදි වේ.

- **I.** උප්පැන්න සහතිකය.
- **II.** ජාතික හැඳුනුම්පත හෝ වලංගු ගමන් බලපත්‍රය හෝ වලංගු දේශීය රියදුරු බලපත්‍රය
- **III.** ගැසට් නිවේදනයේ 7.3 ඡේදයේ සඳහන් පරිදි සහතික කරන ලද ඔබගේ අත්සනින් යුතු මුද්‍රිත අයදුම්පත. **(Print out)**
- **IV.** අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය හා **' Z'** අගය දැක්වෙන සහතිකය. (විද්‍යා / ගණිත විෂය ධාරාව යටතේ 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ (නව නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ (නව නිර්දේශය) විෂයන් 03කින් එකවර සමත්වීම, (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර )

V. අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය. (**විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අ.පො.ස. (උ.පෙළ) / අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛන පමණක් සලකා බලනු** ලැබේ. )

VI. රු. 1,000.00 ක මුදල ගෙවූ බවට සනාථ කෙරෙන රිසිට්පත.

VII. ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය. (**DS 4 ආකෘතිය)**

VIII. ශිෂ්‍ය කාර්ය දර්ශනය. (පාසල් හැරයාමේ සහතිකය - අධ්‍යාපන බී **59** පොදු ආකෘති පත්‍රය)

IX. විවාහය ලියාපදිංචි කර හෝ දික්කසාද වූ හෝ අයෙකු නොවන බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවකු ඉදිරියේ රු. 50.00 ක මුද්දරයක් මත අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශය. (ඇමුණුම 02)

X. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවත්නා රජයේ විශ්වවිද්‍යාලයක/රජයේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් මත උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා "රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද" යටතේ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වී සිටින හෝ හදාරමින් සිටින අයෙකු නොවන බවට ඔබගේ බහුමාන සහතිකය. (වෙබ් අඩවියේ පළ කර ඇති බහුමාන සහතිකය සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය. (ඇමුණුම 03)

XI. උක්ත ලේඛනවල සඳහන් නම්වල වෙනසක් ඇත්නම් සාමදාන විනිශ්චයකරුවකු ඉදිරියේ රු. 50.00 ක මුද්දරයක් මත අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශය.

03. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ මත හා අංක **2350** දරණ **2023.09.15** දිනැති ගැසට් නිවේදනයේ විධිවිධානවලට යටත්ව සිසු හෙද පුහුණුව සඳහා සුදුස්සන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වන සියලුම අයදුම්කරුවන් පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි ඇතුළත් කිසිදු වගන්තියකින් අදහස් නොකෙරෙන බව සැලකිය යුතුය. සම්මුඛ පරීක්ෂණ මගින් පුහුණුව සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ නාම ලේඛනය www.health.gov.lk යන සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළකරනු ලබන අතර ඒ සම්බන්ධයෙන් කිසිම අයදුම්කරුවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.

04. **2024.05.26** දින 2021 කණ්ඩායමේ අයදුම්කරුවන් සඳහා පවත්වනු ලබන අවසන් සම්මුඛ පරීක්ෂණය වන බැවින් නොපැමිණි අයදුම්කරුවන්ට අනිවාර්යයෙන් සහභාගී වන ලෙස දන්වමි. **(2024.05.26 දින පෙ.ව. 8.00ට පෙර පැමිණීමට වගබලා ගත යුතුය)**

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

අත්/කළේ - වෛද්‍ය පී.ජී. මහීපාල
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය.

දුරකථන
தொலைபேசி
Telephone
) 0112669192, 0112675011
) 0112698507, 0112694033
) 0112675449, 0112675280

ෆැක්ස්
பெக்ஸ்
Fax
) 0112693866
) 0112693869
) 0112692913

විද්‍යුත් තැපැල )
மின்னஞ்சல் முகவரி )
E-mail ) postmaster@health.gov.lk

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
Website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) NA/07/03/2023 පොදු/01
ஏனது இல )
My No )

ඔබේ අංකය )
உமது இல )
Your No )

දිනය ) 2024.05. 15
திகதி )
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

**Recruitment for the Student Nursing Training – 2023**
**Calling for the interviews for Absentees.**

According to the Gazette notification No. **2,350** dated **15.09.2023** Interviews had conducted from **13.01.2024** to **18.02.2024** to select the suitable applicants among the 3,862 applicants (completed A/L in year 2019 and 2020) for 2021 batch of nursing training. Among them **994** candidates did not face the interviews. The name list of the absent applicants of the above interview has attached herewith by **attachment 01.** Accordingly the interview has been arranged again on **26.05.2024** at **8.30 am** to check your eligibility at the Ministry of Health, No. 385, Rev. Baddegama Wimalawansha Thero Mawatha, Colombo 10.

02. Accordingly you are kindly informed to be present at the relevant premises as per your calling number given at the name list with the original documents of the followings with the photocopies which are certified to true by you. It should be mentioned your Name, NIC No and the Calling No on the top right corner of the cardboard file with your photocopies.

The documents to be submitted are as follows.

I. Birth Certificate.
II. NIC or valid passport or valid driving license.
III. G.C.E. (A/L) results sheet with the Z score. (pass the 3 subjects at the same time of the science or mathematics steam of year 2019 (old syllabus) or (New syllabus) or pass the 03 subjects at the same time of the year 2020 from the old syllabus or New syllabus (Except General knowledge and English)
IV. G.C.E.(O/L) results sheet (which is issued by the Examination department)
V. Payment receipt for Rs.1,000/-
VI. Gramasewaka certificate.
VII. Student Performance Index (School leaving Certificate - Education B 59 form)
VIII. Affidavit to prove that unmarried or divorced person. which is signed on the stamp of Rs. 100/=
IX. Multidimensional certificate.
X. If there is a name changes of the above documents, need affidavit from the justice in Peace which is duly signed on the stamp of Rs. 100/-

03. Qualified students will be selected by the recommendation of the interview board under the Gazette Notification of 2350 dated 15/09/2023. It is not emphazied that all the applicants who participate the interview are eligible to recruit the Student Nurses Training within any sentence of the above said gazette Notification. The name list of the selected applicants will be published in the website of http://www.health.gov.lk and we do not inform you personally.

04. As this will be the final interview for the absent applicants of 2021 batch, definitely you are informed to participate on **26.05.2024**

**(You should attend on 2024.05.26 before 8.00 am)**

**Chamika H. Gamage**,
Deputy Director General (Admin) II.
For Secretary.

Chamika H. Gamage
Deputy Director General (Administration) I.
Ministry of Health
"Suwasiripaya"
Colombo 10.

Singed By- **Dr.P.G. Mahipala**,
Secretary.
Ministry of Health